GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

25-09-2013

## මාධ්‍ය නිවේදනය

හදිසි ප්‍රතිකාර සේවා වෙනම ක්ෂෙත්‍රයක් ලෙස සෞඛ්‍ය සේවාව තුල විකාශනය වී ඇත. හදිසි අනතුරු හා හෘද රෝග වැනි හදිසි ප්‍රතිකාර සේවා සඳහා රෝහල් වලට හදිසියේ පැමිණෙන රෝගීන් ඉතා කාර්යක්ෂම ලෙස ප්‍රතිකාර කිරීම මේ සෙවාවට අයත්ය.

හදිසි ප්‍රතිකාර අංශයේදි ජිවිත බේරා ගැනීම පමණක් නොව ප්‍රතිකාර පමා වීමෙන් ඇති වන සංකූලතා වලක්වා ගැනීම මෙම ක්ෂෙතයේ ප්‍රධාන අරමුණයි. අනෙකුත් රටවල් මීට දශක ගණනාවකට කලින් මෙම ක්ෂෙත්‍රය ආරම්භ වී ඇත. ලංකාවේ මෙම ක්ෂෙත්‍රය ඇති කිරීමට සෞඛ්‍ය අමාත්‍යංශය, පශ්චාත් උපාධි ආයතනය ,රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ අනෙකුත් ආයතන පුරෝගාමී වී ඇත. තවද මෙහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍යවරු 17ක් 2013 මැයි 07 වන දින තෝරා ගත් අතර තවමත් එම කණ්ඩායමේ පුහුණුව ආරම්භ වී නැත. එනමුත් තවද මේ ක්ෂෙත්‍රය සඳහා 90කට අධික විශේෂඥ වෛද්‍යවරු රටට අවශ්‍ය වී ඇති බව ගණන් බලා ඇති අතර එකඳු සුදුසුකම් ලත් විශේෂඥ වෛද්‍යවරයෙක්වත් මේරටෙහි නැත.

ඊට හේතු වී ඇත්තේ එක්තරා විශේෂඥ වෛද්‍යවරයෙකුගේ කලහකාරී සහ අත්තනෝමතික හැසිරීමයි. ඔහු මේ ආයතනයේ මූලික නිති රීති උල්ලංඝණ කර ඇති අතර නිති කටයුතු මගින් එය ක්‍රියාත්මක කිරීම වලක්වා ඇත. තවද පශ්චාත් උපාධි ආයතනයේ විශේෂඥ මණ්ඩලයේ බහුතරය ඔහු සමග කටයුතු කිරීම ප්‍රතික්ෂේප කර ඇත.

යුද්ධය නිමා කල සියලු ක්ෂෙත්‍ර වල දියුණුවක් අපේක්ෂා කරන යුගයේ මෙවන් පසුගාමී පුද්ගලයන්ගේ ක්‍රියාලකාපයන් නිසා අත්‍යවශ්‍ය රෝගී සේවාවන් හි ගුණාත්මක බවට බාධාවක් වී ඇත.

ස්තුතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516